# සතිපතා ආර්ථික දර්ශක



## 2026 අප්‍රේල් 24

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2026 පෙබරවාරි මාසයේ වාර්තා වූ සියයට 1.6ට සාපේක්ෂව 2026 මාර්තු මාසයේ දී සියයට 2.4ක් දක්වා ඉහළ ගියේය. ආහාර සහ ආහාර නොවන උද්ධමනය පිළිවෙළින් සියයට 0.7ක් සහ සියයට 3.8ක් ලෙස වාර්තා විය. මේ අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2026 පෙබරවාරි මාසයේ වාර්තා වූ සියයට 2.2ක සිට 2026 මාර්තු මාසයේ දී සියයට 2.7ක් දක්වා ඉහළ ගියේය.

2026 ජනවාරි සිට පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, හිතකර පදනම් බලපෑම හේතුවෙන් තේ නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේවෙතත්, රබර් නිෂ්පාදනය, මෙම කාලපරිච්ඡේදය තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ යෑමක් වාර්තා කළේය.

2026 වසරේ අප්‍රේල් 17 සිට 24 දක්වා කාලපරිච්ඡේදය තුළ දී, ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද-ඉරාන සාම සාකච්ඡා ආශ්‍රිත අවිනිශ්චිතතාව මධ්‍යයේ බොරතෙල් මිල ගණන් ඉහළ ගියේය. හෝමූස් සමුද්‍ර සන්ධිය අඛණ්ඩව වසා තැබීම මිල ගණන් තවදුරටත් ඉහළ යෑමට දායක විය. සමස්තයක් ලෙස, සතියකට පෙර පැවැති මිල ගණන් සමඟ සැසඳීමේ දී, සලකා බලන කාලපරිච්ඡේදය අවසානය වනවිට බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි බොරතෙල් බැරලයක මිල, පිළිවෙළින්, එ.ජ. ඩොලර් 7.66කින් සහ එ.ජ. ඩොලර් 3.31කින් ඉහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2026 අප්‍රේල් මස 24 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 16කින් සියයට 9.63 දක්වා පහළ ගියේය.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පෙර සතියේ අග පැවති සියයට 7.67ට සාපේක්ෂව 2026 අප්‍රේල් මස 24 වන දින සියයට 7.72ක් විය.

සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් පහළ ගියේය.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 106.32ක අතිරික්තයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 199.17ක අතිරික්තයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2026 අප්‍රේල් මස 24 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 0.90කින් දර්ශක අගය 22,567.63ක් දක්වා පහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 0.95කින් දර්ශක අගය 6,204.62ක් දක්වා පහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

2026 වසරේ ජනවාරි මාසය තුළ දී රාජ්‍ය ආදායම සහ ප්‍රදාන 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 346.6ට සාපේක්ෂව රුපියල් බිලියන 468.8ක් දක්වා ඉහළ ගියේය.

2026 වසරේ ජනවාරි මාසය තුළ දී සමස්ත වියදම සහ ශුද්ධ ණය දීම් 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 466.0ට සාපේක්ෂව රුපියල් බිලියන 472.6ක් දක්වා ඉහළ ගියේය.

2026 වසරේ ජනවාරි මාසය තුළ දී සමස්ත අයවැය හිඟය 2025 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ රුපියල් බිලියන 119.4ට සාපේක්ෂව රුපියල් බිලියන 3.8ක් දක්වා අඩු විය.

ශුද්ධ දේශීය මූල්‍යනය, 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පැවති රුපියල් බිලියන 130.3ට සාපේක්ෂව, 2026 වසරේ ජනවාරි මාසය තුළ දී රුපියල් බිලියන 15.8ක් දක්වා පහළ ගියේය. විදේශීය මූල්‍යනය, 2025 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ රුපියල් බිලියන 10.9ක ශුද්ධ ණය ආපසු ගෙවීමට සාපේක්ෂව 2026 වසරේ ජනවාරි මාසය තුළ දී රුපියල් බිලියන 12.0ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය.

සතිය තුළ දී ප්‍රාථමික වෙළඳපොළේ දින 91 භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතිකවල දක්නට ලැබුණු ආන්තික වැඩිවීම හැර, ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ දෙකෙහිම භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතික පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි.

පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි.

මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 2.4 ගුණයකට ආසන්න වේ.

පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය සියයට 59.5කින් ඉහළ යෑමක් දක්නට ලැබේ.

## විදේශීය අංශය

2026 වසරේ අප්‍රේල් මස 24 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.3කින් අවප්‍රමාණය විය.


# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක


| ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100) | 2025 | 2026 | |
|---|---|---|---|
| | මාර්තු | පෙබරවාරි | මාර්තු |
| මතුපිට උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 206.0 | 209.4 | 210.9 |
| මාසික ප්‍රතිශත වෙනස % | (0.1) | (0.9) | 0.7 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | (0.4) | 1.2 | 1.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | (1.9) | 1.6 | 2.4 |
| මූලික උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 193.3 | 197.6 | 198.6 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 1.7 | 1.3 | 1.6 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | (0.6) | 2.2 | 2.7 |

| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) | 2025 | 2026 | |
|---|---|---|---|
| | මාර්තු | පෙබරවාරි | මාර්තු |
| මතුපිට උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 191.6 | 195.3 | 195.8 |
| මාසික ප්‍රතිශත වෙනස % | (0.3) | (0.9) | 0.3 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | (0.8) | 0.5 | 0.9 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | (2.6) | 1.6 | 2.2 |
| මූලික උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 178.6 | 182.3 | 183.0 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 2.8 | 1.8 | 2.0 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 0.7 | 2.1 | 2.5 |

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 235.00 | 250.00 | ලැනො. | 248.00 | 240.00 | 260.00 | ලැනො. | 260.00 |
| රතු කැකුළු | 215.00 | 199.00 | ලැනො. | 195.00 | 220.00 | 220.00 | ලැනො. | 215.00 |
| | | | | | | | | |
| බෝංචි | 420.00 | 320.00 | ලැනො. | 370.00 | 470.00 | 370.00 | ලැනො. | 420.00 |
| ගෝවා | 248.00 | 108.00 | ලැනො. | 108.00 | 298.00 | 158.00 | ලැනො. | 158.00 |
| කැරට් | 410.00 | 320.00 | ලැනො. | 270.00 | 460.00 | 370.00 | ලැනො. | 320.00 |
| තක්කාලි | 540.00 | 72.00 | ලැනො. | 124.00 | 590.00 | 116.00 | ලැනො. | 174.00 |
| වට්ටක්කා | 176.00 | 140.00 | ලැනො. | 50.00 | 224.00 | 200.00 | ලැනො. | 100.00 |
| පතෝල | 290.00 | 130.00 | ලැනො. | 210.00 | 340.00 | 200.00 | ලැනො. | 260.00 |
| වම්බටු | 330.00 | 184.00 | ලැනො. | 140.00 | 380.00 | 234.00 | ලැනො. | 190.00 |
| අමු මිරිස් | 400.00 | 270.00 | ලැනො. | 190.00 | 450.00 | 320.00 | ලැනො. | 240.00 |
| දෙහි | 136.00 | 88.00 | ලැනො. | 200.00 | 186.00 | 138.00 | ලැනො. | 250.00 |
| | | | | | | | | |
| රතු ළූණු (දේශීය) | 263.00 | 233.40 | ලැනො. | 270.00 | ලැනො. | 319.00 | ලැනො. | 334.00 |
| ලොකු ළූණු (ආනයනික) | 99.80 | 157.80 | ලැනො. | 130.20 | 140.00 | 190.20 | ලැනො. | 170.00 |
| අර්තාපල් (දේශීය) | 304.60 | 319.40 | ලැනො. | 297.20 | 374.00 | 350.00 | ලැනො. | 350.00 |
| වියළි මිරිස් (ආනයනික) | 555.00 | 963.40 | ලැනො. | 917.60 | 700.00 | 1,021.00 | ලැනො. | 1,010.00 |
| රතු පරිප්පු | 259.60 | 306.00 | ලැනො. | 274.60 | 280.00 | 322.60 | ලැනො. | 301.20 |
| බිත්තර-සුදු (ඒකක මිල) | 23.00 | 37.00 | ලැනො. | 31.60 | 23.50 | 37.70 | ලැනො. | 37.00 |
| පොල් (ගෙඩියක මිල) | 176.00 | 126.00 | ලැනො. | 130.00 | 192.00 | 145.00 | ලැනො. | 140.00 |

### 1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 236.00 | 243.60 | 253.00 | 245.00 |
| සුදු කැකුළු | 211.40 | 199.60 | 199.00 | 195.40 |
| රතු කැකුළු | 215.20 | 204.00 | 198.00 | 197.80 |
| නාඩු | 223.00 | 208.40 | 211.00 | 200.20 |

ලැනො. - ලැබී නොමැත.

සටහන: පසුගිය සතිය තුළ පිටකොටුව වෙළඳපොළ ක්‍රියාත්මක නොවූ අතර, මරදගහමුල වෙළඳපොළෙහි වාර්තා වූ මිල ගණන් දින දෙකක කාලසීමාවක් පදනම් කර ගනිමින් ගණනය කරන ලද සාමාන්‍ය මිල අගයන් වේ. පසුගිය සතිය තුළ වෙළඳපොළවල වෙළඳ කටයුතු වාර්තා වූයේ අවම මට්ටමකය.


## 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 240.00 | 240.00 |
| රතු කැකුළු | 203.00 | 203.00 |
| බෝංචි | 205.00 | 305.00 |
| ගෝවා | 95.00 | 68.00 |
| කැරට් | 275.00 | 227.00 |
| තක්කාලි | 97.50 | 55.60 |
| වට්ටක්කා | 51.50 | 50.40 |
| පතෝල | 110.00 | 121.00 |
| වම්බටු | 145.00 | 109.60 |
| අළු කෙසෙල් | 145.00 | 94.00 |
| රතු ළූණු (දේශීය) | 237.50 | 209.00 |
| රතු ළූණු (ආනයනික) | ලැනො. | 247.00 |
| ලොකු ළූණු (ආනයනික) | 134.00 | 132.40 |
| අර්තාපල් (දේශීය) | 217.50 | 229.00 |
| අර්තාපල් (ආනයනික) | 141.50 | 129.60 |
| වියළි මිරිස් (ආනයනික) | 950.00 | 976.00 |
| පොල් (ගෙඩියක මිල) | 110.00 | 111.60 |


## 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සුදු නාඩු | ලැනො. | 215.00 |
| රතු කැකුළු | ලැනො. | 220.00 |
| බෝංචි | ලැනො. | 592.00 |
| ගෝවා | ලැනො. | 276.00 |
| කැරට් | ලැනො. | 452.00 |
| තක්කාලි | ලැනො. | 240.00 |
| වට්ටක්කා | ලැනො. | 144.00 |
| පතෝල | ලැනො. | 392.00 |
| වම්බටු | ලැනො. | 328.00 |
| අමු මිරිස් | ලැනො. | 496.00 |
| රතු ළූණු (දේශීය) | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු (ආනයනික) | ලැනො. | 232.00 |
| අර්තාපල් (දේශීය) | ලැනො. | 376.00 |
| අර්තාපල් (ආනයනික) | ලැනො. | 232.00 |
| වියළි මිරිස් (ආනයනික) | ලැනො. | 1,280.00 |
| රතු පරිප්පු | ලැනො. | 360.00 |
| සුදු සීනි | ලැනො. | 250.00 |
| බිත්තර- සුදු (ඒකක මිල) | ලැනො. | 36.60 |
| පොල් (ගෙඩියක මිල) | ලැනො. | 189.00 |


### නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල




## 1.2.5 මාළු වෙළඳපොළ

| | පෑලියගොඩ | | මීගමුව | | | | නාරාහේන්පිට | |
|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය |
| කෙලවල්ලා | 1,700.00 | 1,600.00 | 1,150.00 | 1,110.00 | 1,790.00 | 1,660.00 | ලැනො. | 2,592.00 |
| බලයා | 1,000.00 | 940.00 | ලැනො. | 992.50 | ලැනො. | 1,220.00 | ලැනො. | 1,164.00 |
| සාලයා | 250.00 | 576.00 | 350.00 | 544.00 | 460.00 | 660.00 | ලැනො. | 710.00 |
| හුරුල්ලා | 1,100.00 | 1,050.00 | ලැනො. | 1,073.33 | ලැනො. | 1,300.00 | ලැනො. | 1,320.00 |


ලැනො. - ලැබී නොමැත.

සටහන: පසුගිය සතිය තුළ නාරාහේන්පිට වෙළඳපොළ වසා තිබූ අතර, දඹුල්ල වෙළඳපොළෙහි වාර්තා වී ඇති මිල ගණන් දින දෙකක සාමාන්‍ය මිල අගයන් මත පදනම්ව වාර්තා කර ඇත. පෑලියගොඩ සහ මීගමුව මාළු වෙළඳපොළවල මිල ගණන් එක් දිනක සාමාන්‍ය මිල අගයන් මත පදනම්ව වාර්තා කර ඇත. සමස්තයක් ලෙස, පසුගිය සතිය තුළ වෙළඳපොළවල වෙළඳ කටයුතු අවම මට්ටමක වාර්තා විය.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | සිව්වන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2024 (අ)(ආ) | 2025 (ආ) | 2024 (අ)(ආ) | 2025 (ආ) |
| කෘෂිකාර්මික | 0.6 | 1.4 | (2.8) | 2.1 |
| කාර්මික | 11.1 | 7.8 | 13.1 | 7.3 |
| සේවා | 2.4 | 3.3 | 2.8 | 3.1 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු -සහනාධාර | 10.9 | 12.3 | 15.5 | 14.0 |
| දළ දේශීය නිෂ්පාදිතය | 5.0 | 5.0 | 5.5 | 4.8 |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික




## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | පෙබරවාරි | | % වෙනස |
|---|---|---|---|
| | 2025 (අ) | 2026 (අ) | |
| තේ (කි.ග්‍රෑ. මිලියන) | 15.6 | 18.0 | 15.2 |
| රබර් (කි.ග්‍රෑ. මිලියන) | 7.4 | 4.9 | (33.6) |
| | දෙසැම්බර් | | % වෙනස |
| | 2024 (අ) | 2025 (අ) | |
| පොල් (ගෙඩි මිලියන) | 170.1 | 254.5 | 49.6 |

(අ) තාවකාලික





මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය

## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | පෙබරවාරි | | % වෙනස |
|---|---|---|---|
| | 2025 (ආ) | 2026 (ඇ) | |
| කාර්මික නිෂ්පාදන දර්ශකය | 93.4 | 97.3 | 4.1 |
| ආහාර නිෂ්පාදන | 97.3 | 102.3 | 5.2 |
| ඇඟලුම් නිෂ්පාදන | 86.6 | 102.4 | 18.3 |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 112.8 | 108.2 | (4.1) |
| අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 95.1 | 94.5 | (0.6) |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 88.0 | 68.6 | (22.0) |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 73.4 | 77.4 | 5.3 |
| පාන වර්ග | 111.7 | 110.6 | (1.0) |

(අ) ප්‍රධාන උප අංශ 7
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික





## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | 2025 | | 2026 | |
|---|---|---|---|---|
| | පෙබ | මාර් | පෙබ | මාර් |
| දර්ශකය | 56.8 | 63.9 | 56.8 | 66.7 |


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | 2025 | | 2026 | |
|---|---|---|---|---|
| | පෙබ | මාර් | පෙබ | මාර් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය | 56.5 | 69.8 | 54.4 | 59.4 |

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම් | 2025 | | 2026 | |
|---|---|---|---|---|
| | ජන | පෙබ | ජන | පෙබ |
| සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය | 52.9 | 55.6 | 75.0 | 70.3 |

(අ) පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, සේවා සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ මූලික දර්ශක ලෙස පිළිවෙළින්, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය සැලකෙන අතර, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, උප-දර්ශක පහක බරිත සාමාන්‍යයක් ලෙස ගණනය කරනු ලැබේ. තවද, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය හා සැසඳිය හැකිය.







## 1.7 සේවා නියුක්තිය [අ]

| අයිතමය | 2025 [ආ] | 2024 කාර්තු:4 | 2025 කාර්තු:4 |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 49.4 | 47.7 | 48.8 |
| සේවා වියුක්ති අනුපාතිකය | 3.9 | 4.2 | 3.8 |

අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන් [ඇ] (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)


| | 2024 | 2025 කාර්තු:3 | 2025 කාර්තු:4 |
|---|---|---|---|
| කෘෂිකර්මාන්ත | 26.0 | 23.4 | 23.2 |
| කර්මාන්ත | 25.6 | 26.8 | 26.3 |
| සේවා | 48.5 | 49.8 | 50.6 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.8 වැටුප් ප්‍රමාණ දර්ශක


| අයිතමය | 2025 මාර් | 2026 මාර් | වෙනස % |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) - නාමික | 175.4 | 192.6 | 9.8 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100) - නාමික | 188.2 | 198.8 | 5.6 |
| කෘෂිකර්මාන්ත | 189.8 | 198.6 | 4.6 |
| කර්මාන්ත | 187.5 | 200.4 | 6.9 |
| සේවා | 187.9 | 194.9 | 3.7 |





## 1.9 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2025 | | | 2026 | | |
|---|---|---|---|---|---|---|
| | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) [ඈ] [ඉ] | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) [ඈ] [ඉ] |
| | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | |
| ජනවාරි | 77.90 | 74.77 | 76.14 | 63.96 | 59.60 | 68.11 |
| පෙබරවාරි | 75.12 | 71.37 | 76.32 | 69.16 | 64.33 | 66.67 |
| මාර්තු | 71.41 | 67.88 | 83.33 | 99.74 | 91.72 | 66.48 |
| අප්‍රේල් | 66.96 | 63.54 | 83.47 | | | |
| මැයි | 63.96 | 60.86 | 75.75 | | | |
| ජූනි | 70.13 | 68.14 | 70.79 | | | |
| ජූලි | 69.29 | 66.94 | 66.70 | | | |
| අගෝස්තු | 67.47 | 64.23 | 66.84 | | | |
| සැප්තැම්බර් | 67.63 | 63.69 | 73.51 | | | |
| ඔක්තෝබර් | 64.25 | 60.33 | 72.86 | | | |
| නොවැම්බර් | 63.69 | 59.51 | 72.59 | | | |
| දෙසැම්බර් | 61.81 | 58.02 | 68.40 | | | |

| දිනය | 2025 | | 2026 | |
|---|---|---|---|---|
| 17-04 | 66.17 | 62.91 | 98.39 | 93.38 |
| 18-04 | - | - | - | - |
| 19-04 | - | - | - | - |
| 20-04 | - | - | 94.68 | 88.38 |
| 21-04 | 66.81 | 63.59 | 95.14 | 88.50 |
| 22-04 | 66.76 | 63.73 | 98.32 | 89.39 |
| 23-04 | 67.85 | 64.31 | 103.02 | 94.18 |
| 24-04 | 66.28 | 62.42 | 106.05 | 96.69 |





මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1.10 දෛනික විදුලිබල උත්පාදනය

| | 2026-04-20 | 2026-04-21 | 2026-04-22 | 2026-04-23 |
|---|---|---|---|---|
| උපරිම ඉල්ලුම (මෙ. වො.) | 2,600.90 | 2,852.00 | 2,824.80 | 2,730.70 |
| මුළු උත්පාදනය (ගි. වො. පැ.) | 52.49 | 54.84 | 57.15 | 56.36 |
| ජල (ගි. වො. පැ.) | 11.68 | 15.03 | 13.90 | 14.27 |
| ගල් අඟුරු (ගි. වො. පැ.) | 12.61 | 14.35 | 17.66 | 17.83 |
| තෙල් (ගි. වො. පැ.) | 19.52 | 12.99 | 13.54 | 13.99 |
| සුළං (ගි. වො. පැ.) | 0.29 | 0.17 | 0.22 | 0.27 |
| සූර්ය (ගි. වො. පැ.) | 8.15 | 11.86 | 11.45 | 9.85 |
| ජෛව ස්කන්ධය (ගි. වො. පැ.) | 0.24 | 0.43 | 0.38 | 0.15 |




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

(අ) කුටුම්භ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි
(ආ) කාර්තු හතරේ සාමාන්‍යය මත දත්ත පදනම් වේ.
(ඇ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ඈ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2023 වසරේ පෙබරවාරි, සැප්තැම්බර් සහ 2024 අගෝස්තු යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.
(ඉ) තාවකාලික

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රතිපත්ති පොලී අනුපාතික | වසරකට පෙර | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|
| එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) [අ] | 8.00 | 7.75 | 7.75 |
| **නිත්‍ය පහසුකම් අනුපාතික [අ]** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.50 | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.50 | 8.25 | 8.25 |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිය අවසානයට) | 7.97 | 7.67 | 7.72 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ) [ආ]** | | | |
| දින 91 | 7.62 | 8.15 | 8.27 |
| දින 182 | 7.98 | 8.22 | 8.23 |
| දින 364 | 8.29 | 8.52 | 8.52 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 8.39 | 9.79 | 9.63 |

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය




| | 2025 පෙබරවාරි | 2026 ජනවාරි | 2026 පෙබරවාරි |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25 - 9.00 | 0.25 - 9.00 | 0.25 - 9.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 2.50 - 12.00 | 2.50 - 12.00 | 2.50 - 12.00 |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 7.21 | 6.81 | 6.83 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 8.84 | 8.42 | 8.37 |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 6.25 | 6.41 | 6.23 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 6.51 | 7.01 | 6.66 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 11.99 | 11.59 | 11.62 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 10.45 | 11.03 | 11.11 |
| බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය (AWSR) [ඇ] | 12.20 | 11.64 | 11.64 |
| බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය (AWNSR) [ඇ] | 11.07 | 11.36 | 11.31 |

| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025 පෙබරවාරි | 2026 ජනවාරි | 2026 පෙබරවාරි |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 7.00 | 6.75 | 6.75 |

| භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය [ආ] | වසර 04 මාස 03 2026 අප්‍රේ. 09 | වසර 8 මාස 02 2026 අප්‍රේ. 09 | වසර 11 මාස 03 2026 අප්‍රේ. 09 |
|---|---|---|---|
| පොලී අනුපාතිකය | 9.75 | 10.75 | 10.75 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 10.12 | 11.16 | 11.19 |

**බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව**

| | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|
| ලංකා බැංකුව | 9.87 | 9.73 |
| මහජන බැංකුව | 9.73 | 9.60 |
| හැටන් නැෂනල් බැංකුව | 10.46 | 9.84 |
| කොමර්ෂල් බැංකුව | 10.00 | 9.99 |
| සම්පත් බැංකුව | 10.16 | 9.98 |
| සෙලාන් බැංකුව | 9.87 | 10.01 |
| යුනියන් බැංකුව | 11.47 | 10.86 |
| පැන් ඒෂියා බැංකුව | 11.87 | 11.39 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 10.03 | 10.00 |
| ඩීඑෆ්සීසී බැංකුව | 10.62 | 9.83 |
| එන්ඩීබී බැංකුව | 11.35 | 11.26 |
| අමානා බැංකුව | 11.28 | 11.06 |

| | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|
| කාර්ගිල්ස් බැංකුව | 11.05 | 12.29 |
| එච්එස්බීසී බැංකුව | 9.58 | 10.27 |
| ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 8.75 | 9.02 |
| සිටි බැංකුව [ඈ] | 8.25 | 8.25 |
| ඩොයිෂ් බැංකුව | 8.46 | 8.26 |
| හබීබ් බැංකුව | 10.89 | 9.39 |
| ඉන්දියන් බැංකුව | 12.50 | 12.62 |
| ඉන්දියන් ඕවර්සීස් බැංකුව | 9.17 | 9.39 |
| එම්සීබී බැංකුව | 10.38 | 9.64 |
| ඉන්දීය රාජ්‍ය බැංකුව [ඈ] | 9.09 | 9.09 |
| පබ්ලික් බැංකුව | 10.06 | 9.29 |
| බැන්ක් ඔෆ් චයිනා | - | - |

(අ) 2024 නොවැම්බර් 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ලෙස අර්ථ දැක්වේ. පදනම් අංක ± 50 ආන්තික සමඟ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කෙරේ.


(ආ) රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙන් ඵලදා අනුපාතික ලබා ගනු ලැබේ.


(ඇ) බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය මගින් බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශයට ලබා දී ඇති සියලුම රුපියල් ණය සඳහා අදාළ පොලී අනුපාතික පිළිබිඹු කරන අතර, බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය මගින් යම්කිසි මාසයක් තුළ බලපත්‍රලාභී බැංකු විසින් ලබා දෙන නව රුපියල් ණය සඳහා පොලී අනුපාතික පිළිබිඹු කරයි. මෙම පොලී අනුපාතික ද්විත්වයම ගණනය කිරීමේ දී රජයේ ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රම සහ බැංකුවල පවත්නා අක්‍රීය ණය බැහැර කරයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමීක්ෂණය මත පදනම්ව බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය ගණනය කරනු ලැබේ. සම්මත නිර්වචනයට අනුකූලව, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශය නිර්වචනය කිරීම සඳහා මෙම සමීක්ෂණය රුපියල් බිලියන 1 නොඉක්මවන වාර්ෂික පිරිවැටුම් නිර්ණායකයක් භාවිතා කරයි.


(ඈ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත. එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත.

## 2.2 මුදල් සැපයුම

| | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | පෙබ. 2025 | ජන. 2026 | පෙබ. 2026 (අ) | පෙබ. 2025 | ජන. 2026 | පෙබ. 2026 (අ) |
| සංචිත මුදල් | 1,589.6 | 1,789.7 | 1,848.8 | 12.4 | 14.2 | 16.3 |
| පටු මුදල් සැපයුම (M1) | 1,938.3 | 2,251.9 | 2,319.6 | 19.1 | 19.2 | 19.7 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 12,825.9 | 14,200.4 | 14,375.8 | 10.9 | 11.6 | 12.1 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 14,543.8 | 16,069.0 | 16,276.3 | 10.2 | 11.3 | 11.9 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් (ආ) | 794.7 | 1,134.2 | 1,377.4 | 348.2 | 51.8 | 73.3 |
| මුදල් අධිකාරීන් | 316.4 | 767.0 | 979.5 | 146.1 | 187.7 | 209.6 |
| වාණිජ බැංකු | 478.4 | 367.3 | 397.9 | 30.7 | (23.6) | (16.8) |
| දේශීය බැංකු ඒකක (DBUs) | (160.9) | (524.1) | (489.9) | 31.2 | (191.2) | (204.5) |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 639.3 | 891.4 | 887.7 | 6.6 | 34.9 | 38.9 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම් (ආ) | 13,749.0 | 14,934.7 | 14,898.9 | 1.7 | 9.1 | 8.4 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 8,262.2 | 8,257.0 | 8,140.1 | (0.7) | (0.6) | (1.5) |
| මහ බැංකුව | 1,719.2 | 1,820.2 | 1,755.8 | (20.5) | 5.3 | 2.1 |
| වාණිජ බැංකු | 6,543.0 | 6,436.8 | 6,384.3 | 6.3 | (2.2) | (2.4) |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,484.6 | 6,350.0 | 6,299.7 | 8.7 | (2.6) | (2.9) |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 58.4 | 86.8 | 84.6 | (69.1) | 42.8 | 44.8 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 647.3 | 505.0 | 519.4 | (11.7) | (22.1) | (19.7) |
| දේශීය බැංකු ඒකක (DBUs) | 595.2 | 422.7 | 437.2 | (12.3) | (29.0) | (26.6) |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 52.0 | 82.2 | 82.3 | (4.5) | 57.4 | 58.2 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 8,256.9 | 10,294.8 | 10,439.1 | 12.8 | 26.3 | 26.4 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 7,666.8 | 9,738.9 | 9,881.5 | 12.9 | 28.9 | 28.9 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 590.1 | 555.9 | 557.7 | 11.4 | (6.6) | (5.5) |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | (3,417.3) | (4,122.0) | (4,199.7) | (19.9) | (20.7) | (22.9) |












## 2.3 සංචිත මුදල් හා සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

| | 2026-04-16 | 2026-04-23 |
|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 2,046,761.61 | 1,979,749.58 |

| | 2026-04-17 | 2026-04-24 |
|---|---|---|
| සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් (රුපියල් මිලියන) | 1,788,997.79 | 1,716,156.32 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| ඒක් ෂණ මුදල් වෙළඳපොළ | 2026-04-20 | 2026-04-21 | 2026-04-22 | 2026-04-23 | 2026-04-24 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 7.67 | 7.68 | 7.70 | 7.71 | 7.72 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 37.94 | 66.30 | 56.85 | 44.73 | 43.20 |

| වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් | 2026-04-20 | 2026-04-21 | 2026-04-22 | 2026-04-23 | 2026-04-24 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 7.70 | 7.70 | 7.71 | 7.72 | 7.74 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 84.30 | 63.03 | 65.35 | 101.45 | 76.00 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| | 2026-04-20 | 2026-04-21 | 2026-04-22 | 2026-04-23 | 2026-04-24 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් බිලියන) | 2,508.9 | 2,508.9 | 2,508.9 | 2,508.9 | 2,508.9 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් බිලියන) | 1,585.8 | 1,585.2 | 1,585.1 | 1,584.8 | 1,584.6 |

(අ) සංශෝධිත
(ආ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට (M2b) අදාළව

## 2.6 විවට වෙළඳපොළ කටයුතු

| අයිතමය | 2026-04-20 | 2026-04-21 | 2026-04-22 | 2026-04-23 | 2026-04-24 |
|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | - | - | - | - | - |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලි( | - | - | - | - | - |
| පියවීමේ දිනය | - | - | - | - | - |
| පරිණත වන දිනය | - | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පියවීමේ දිනය | - | - | - | - | - |
| පරිණත වන දිනය | - | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පියවීමේ දිනය | - | - | - | - | - |
| පරිණත වන දිනය | - | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| **නිත්‍ය පහසුකම** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 138.44 | 151.52 | 167.01 | 182.06 | 212.34 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 26.00 | 28.20 | 16.00 | 14.60 | 13.18 |
| | | | | | |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | **112.44** | **123.32** | **151.01** | **167.46** | **199.17** |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)[අ]** | **112.44** | **123.32** | **151.01** | **167.46** | **199.17** |

(අ) සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම් /ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් සහ වාණිජ පත්‍රිකා නිකුතු


### 2.7.1 ණය කාඩ්පත් (අ)


| | 2025 දෙසැම්බර් | 2026 ජනවාරි | 2026 පෙබරවාරි (ආ) |
|---|---|---|---|
| මුළු සක්‍රීය කාඩ්පත් ගණන | 2,166,186 | 2,176,299 | 2,193,380 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 8,915 | 8,843 | 8,780 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 2,157,271 | 2,167,456 | 2,184,600 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 189,706 | 190,157 | 190,648 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 39,492 | 39,108 | 39,473 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 150,214 | 151,049 | 151,175 |

### 2.7.2 වාණිජ පත්‍රිකා නිකුතු (ඇ)

| | 2025 දෙසැම්බර් | 2026 ජනවාරි | 2026 පෙබරවාරි (ආ) |
|---|---|---|---|
| සමස්ත නිකුතුව - සමුච්චිත(ඈ) (රු. බිලියන) | 5.4 | 0.0 | 0.0 |
| නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට) | 1.4 | 1.4 | 1.4 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද
(ආ) තාවකාලික
(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව
(ඈ) වසරේ මේ දක්වා එකතුව





## 2.8 කොටස් වෙළඳපොළ

| | 2025-04-24 | 2026-04-17 | 2026-04-24 |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ASPI) | 15,615.63 | 22,773.29 | 22,567.63 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) (S&P SL20) | 4,604.71 | 6,263.94 | 6,204.62 |
| දෛනික පිරිවැටුම (රු. මිලියන) | 1,471.14 | 4,974.72 | 2,068.86 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 5,580.83 | 8,211.17 | 8,146.50 |
| විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 81.72 | 195.38 | 38.59 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 46.50 | 391.87 | 69.65 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | 35.22 | (196.49) | (31.06) |

දෛනික කොටස් වෙළඳපොළ දර්ශක





මූලය: කොළඹ කොටස් වෙළඳපොළ

# රාජ්‍ය මූල්‍ය අංශය

## 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2025 ජනවාරි | 2026 ජනවාරි (අ) |
|---|---|---|
| ආදායම් සහ ප්‍රදාන | 346.58 | 468.75 |
| ආදායම | 346.58 | 468.75 |
| බදු ආදායම | 321.48 | 434.23 |
| බදු නොවන ආදායම | 25.10 | 34.52 |
| ප්‍රදාන | 0.00 | 0.00 |
